# හමුදාවට න්‍යාය පත්‍රයක් අවශ්‍යයි

නැගෙනහිර පළාත නැවත වරක් උණුසුම් වී ඇත. කොටි මරුගල් ආරු සොරොව්ව වසා දැමීමට තීරණය කළා පමණක් නොව මුතුර් ප්‍රදේශයේ දැවැන්ත ප්‍රහාරයක් ද දියත් කළහ. කොටි නැගෙනහිර පළාත, විශේෂයෙන්ම මුතුර් අවට ප්‍රදේශය ගැන වැඩි සැලකිල්ලක් දක්වන්නේ ඇයි ද යන්න පිළිබඳ අපේ අවධානය යොමු විය යුතුය. එහෙත් ඒ සියල්ලටම වඩා බටහිර ජනමාධ්‍ය හා ඇතැම් දේශපාලකයන් දෙමළ ජාතිවාදීන් සමග එක්වී ගෙන යන ප්‍රචාර ගැන ද අප විමසිලිමත් විය යුතුය.

මේ ලිපිය ලියන අවස්ථාව වනවිට ලංකාණ්ඩුවේ හමුදා මුතුර් ප්‍රදේශයේදී කොටින්ට ප්‍රතිප්‍රහාර දී ඔවුන් පසුබස්සන බව දැනගන්නට ලැබෙනු ඇත. එහෙත් ප්‍රතිප්‍රහාර දීම ඇරඹීමට යම් කාලයක් ගතවී ඇති බවද පැහැදිලිය. බදාදා අලුයම් කාලයෙහි දී ඇරඹි කොටි ප්‍රහාර මැඩ පැවැත්වීමට තරමක කාලයක් ගතවන තුරු කිසිවක් කිරීමට හමුදා අසමත්වී ඇත්තේ ඇයි? එයට හේතුව ඒ අලුයම් කාලයෙහි දී කිසිවක් නොපෙනීමද? එය හේතුවක් ලෙස සැලකීමට අපට නොහැකිය. රාත්‍රි හෝ අලුයම් කාලයෙහි එල්ල කරන ප්‍රහාරවලට ඒ ආසන්නයෙහිම ප්‍රති ප්‍රහාරයක් දියත් කිරීමට හමුදාවට තවමත් නොහැකි ඇයි? කොටි පහර දෙන්නේ ද ඇඳිරි කාලයෙහි ය. අපේ හමුදාවට රාත්‍රි කාලයෙහි ද යම්කිසි කාල සීමාවකට යටත්ව කොටින්ට පහරදී කොටි සුන්නත් දූලි කර දැමීමට අවස්ථාව ලබාදිය යුතුය. කොටි මුතුර් හි පමණක් නොව වෙනත් තැන්වල ද, හමුදාවට රාත්‍රි කාලයෙහි දී පහර දෙන බව අමුතුවෙන් කිවයුතු නොවෙයි. එසේ නම් අප කළ යුතුව තිබුණේ අලුයම පහරදීමත් සමග ප්‍රතිප්‍රහාර දීමට හමුදාවට පුහුණුවක් ලබාදීමය.

කොටින්ට නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයෙහි බලය තහවුරු කිරීමේ අවශ්‍යතාව වෙයි. එමෙන් ම ඒ දිස්ත්‍රික්කයෙහි වාසය කරන සිංහලයන් ඉන් එළවා දැමීමේ අවශ්‍යතාව ද කොටින් ට වෙයි. දෙමළ ජාතිවාදීන් හැමදාමත් බලාපොරොත්තු වූයේ ත්‍රිකුණාමලය ඊනියා දෙමළ ඊළමේ අගනුවර බවට පත් කිරීමය. විශේෂයෙන් ම නැගෙනහිර පළාත හා උතුරු පළාත යාකරන වැලිඔය ප්‍රදේශයෙන් සිංහලයන් ඉවත් කිරීමේ අවශ්‍යතාවද කොටි සංවිධානයට වෙයි. ඡන්ද කොට්ඨාසයක් ලෙස ගත් කල සේරුවිල කොටින්ගේ අවධානයට ලක්වන ප්‍රධාන ම ප්‍රදේශයකි. මේ ප්‍රදේශවල කොටි පරාජය කිරීමට හමුදාවට ස්ථාවර වැඩපිළිවෙළක් ඇතැයි සිතිය නොහැකිය. හමුදාවට ඉලක්ක සහිත ක්‍රියාදාමයක් නොමැතිවීම කොටින්ට වාසි අත්කරදෙයි. අද හමුදාව හා කොටි අතර (නො)කෙරෙන සටනෙහි න්‍යාය පත්‍රය සකස් කරනු ලබන්නේ කොටි හා බටහිරයන් විසිනි. හමුදාව කරන්නේ කොටින්ගේ හා බටහිරයන්ගේ න්‍යාය පත්‍රයට ප්‍රතිචාර දැක්වීම පමණකි. හමුදාව ඊනියා සීමිත ප්‍රතිචාරවලට පමණක් සීමාවෙයි. මෙය තවදුරටත් කරගෙන යා හැක්කක් නොවෙයි. සටනේ න්‍යාය පත්‍රය සකස් කිරීම හමුදාව අතට ගත යුතු වෙයි. හමුදාව එසේ නොකරන්නේ කුමන කරුණු හේතුකොටගෙන ද ? පළමුවෙන් ම එයට වගකිවයුත්තේ ඊනියා සටන් විරාම ගිවිසුමය. සටන් විරාම ගිවිසුමෙන් සටන් විරාමයක් ඇතිවූවා නොවෙයි. ඉන් සටනේ න්‍යාය පත්‍රය සැකසීම නිල වශයෙන් ම කොටි සංවිධානයට භාරකෙරිණි. ගිවිසුමෙන් කෙරුණේ කොටි සංවිධානයත් ආණ්ඩුවත් එක මට්ටමක ලා සැලකීමත්, හමුදාවට හා කොටි ත්‍රස්තවාදීන්ට එකම ආකාරයකින් සැලකීමත්ය. නිල වශයෙන් තත්ත්වය එසේ වුවද, ප්‍රායෝගික වශයෙන් ගත් කල කොටින්ට වඩා බලතල ලැබිණි.

රට නිල වශයෙන්ම ඊනියා මුදාගත් ප්‍රදේශ හා මුදා නොගත් ප්‍රදේශ යනුවෙන් ප්‍රදේශ දෙකකට වෙන් කෙරිණි. ඊනියා මුදාගත් ප්‍රදේශවලට කොටින්ට කිසිම තහනමක් නැතිව ඇතුල්වීමේ වරප්‍රසාදය හිමිවිණි. එහෙත් ඊනියා මුදා නොගත් ප්‍රදේශවලට හමුදාවට පමණක් නොව සාමාන්‍ය සිවිල් ජනයාටද වැරැදීමකින්වත් ඇතුළුවිය නොහැකිය. සාමාන්‍ය වැසියෝ සටන් විරාම ගිවිසුම මගින් ඇතිකෙරී ඇති මේ ඊනියා දේශ සීමා නොදනිති. මී පැණි සෙවීමට දර සෙවීමට කැලෑ වදින ගැමියෝ ඇතැම් විට නොදැනුවත්වම ඊනියා මුදානොගත් ප්‍රදේශවලට ඇතුළුවෙති. ඔවුන් එවැනි අවස්ථාවක කොටින්ට අසුවුවහොත් ඔවුන්ට කාගේවත් පිහිටක් නැත. ඔවුන්ට සිදුවන්නේ කොටින්ගේ සිරුකරුවන් බවට පත්වීමටය. ඊනියා මුදා නොගත් ප්‍රදේශවලට ඇතුළුවීම හමුදා විසින් කරන ලද යුද්ධ ප්‍රකාශ කිරීමක් ලෙස අර්ථ දැක්වීමට කොටි උපයෝගී කරගන්නේ රනිල් වික්‍රමසිංහ අත්සන් කරන ලද ඊනියා සටන් විරාම ගිවිසුම ය. ඒ ද්‍රෝහී ගිවිසුම හේතුකොටගෙන කලින් සඳහන් කරනලද සමාන කිරීම් ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව විසින් කෙරී ඇති

© Prof. Nalin De Silva

අතර සිංහලයන්ටද එක් සමාන කිරීමක් කළ හැකිය. ඒ ගිවිසුම අත්සන් කළ රනිල් වික්‍රමසිංහ හා ප්‍රභාකරන් සම්බන්ධයෙනි. සිංහලයන්ගේ පැත්තෙන් බැලූ කල මේ ගිවිසුම තරම් ද්‍රෝහී ගිවිසුමක් දොන් ජුවන් ධර්මපාලට රජකම දීම සම්බන්ධයෙන් ඇති කරගන්නා ලද ගිවිසුමෙන් මෙපිට අත්සන් කෙරී නැත. එසේ තිබියදී ද ජනාධිපතිවරණයේදී සුළුතරයක් වුවද ඇතැම් සිංහලයන් රනිල් වික්‍රමසිංහට ඡන්දය දීම පක්ෂ දේශපාලනයෙහිම ප්‍රතිඵලයක් විය. ඔහු කෙසේ වුවත් දිනාවිය යන කොටින්ගේ වැරැදි විශ්වාසය උඩ කොටි අවසාන පැයේදී ජනාධිපතිවරණය වර්ජනය කිරීමට තීරණය නොකරන්නට රනිල් වික්‍රමසිංහට ජනාධිපති විය හැකිව තිබුණු බව අමතක නොකළ යුතුය. ඔහු ජනාධිපති වී නම් මේ වනවිටත් දෙමළ ඊළම පිහිටුවා රටේ ස්වෛරීභාවය නැතිකර අවසන්ය.

ආණ්ඩුව ජිනීවා ගිවිසුමක් කඩකිරීම ගැන ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය සුළු දේශපාලන වාසියක් ගැනීමට අසාර්ථක උත්සාහයක යෙදුණේය. ආණ්ඩුව කියා සිටියේ මරුගල් ආරු සොරොව්ව වැසීමෙන් කොටි ජිනීවා ගිවිසුම කඩකර ඇති බවය. ආණ්ඩුව එවැන්නක් ප්‍රකාශ නොකර සිටිය යුතුව තිබිණි. වතුර ලබාදීම වැනි දෑ නොකිරීම ගැන සඳහන් වන්නේ කිනම් ජාත්‍යන්තර ගිවිසුමක වුව ද එය කොටි සම්බන්ධයෙන් අදාළ නොවෙයි. අදාළ ගිවිසුම රටවල්වලට පමණක් නොව රටක අභ්‍යන්තර සංවිධානවලටද බලපාන්නේ යැයි ආණ්ඩුව කියයි. ඒ එසේ වුවද එවැනි අවස්ථාව වුවද, කොටි සංවිධානය සම්බන්ධයෙන් මනුෂ්‍යත්වය, නීත්‍යනුකූලභාවය ආදිය ගැන කතා කිරීමට යෑම තේරුමක් නැති දෙයකි. ලෝක ඉතිහාසයේ ඇති වී තිබෙන ම්ලේච්ඡතම සංවිධානයක් සම්බන්ධයෙන් කිනම් හෝ නීතියක් ගැන කතාකිරීම අවසානයේදී කොටින්ට ම වාසිදායක කරුණක් වෙයි. ආණ්ඩුව කළ යුත්තේ නීති ගැන කතා කිරීම නොව කොටි පරාජය කිරීමට සැලැස්මක් ඇති කර ගැනීමය. ඒ අතර රනිල් වික්‍රමසිංහ බටහිරයන්ගේ බහට ඔවුන්ගේ සුවච කීකරු සේවකයකු ලෙස අත්සන් කළ ඊනියා සටන් විරාම ගිවිසුම ගැන ජනතාවට තවතවත් කරුණු හෙළි කිරීමය.

ආණ්ඩුව ඊනියා සටන් විරාම ගිවිසුම නිසා හිරවී ඇත. ඒ අහෝසි කිරීමට පියවර ගතහොත් කොටි සංවිධානයද, බටහිරයන් ද, මෙරට සිටින ඔවුන්ගේ ගැත්තන් ද කියනු ඇත්තේ ආණ්ඩුව ඊනියා යුද්ධය ඇරඹීමට කටයුතු කළ බවය. අනෙක් අතට ද්‍රෝහී සටන් විරාම ගිවිසුම තවදුරටත් පවත්වාගෙන යෑම යනු ආණ්ඩුවේ හා හමුදාවේ අතපය බැඳ ගැනීමකි. බටහිරයන්ට අප ගැතිවී ඇත්තේ අපේ අධ්‍යාපනය, ඒ සමග අපට ලබාදෙන නිවටකම, සුද්දන් විසින් ඇතිකරන ලද අපේ හීනමානය ආදී කරුණු රාශියක් හේතුකොටගෙනය. ආණ්ඩුව කරවන්නන්ටත් නිලධාරීන්ටත් ඒ සියල්ල එක් රැයකින් නැතිකළ හැකි නොවෙයි. එහෙත් අප ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවගේ හෙවත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රකාශවලට එතරම් වැදගත් තැනක් දිය යුතු නොවෙයි ඔවුන් කිනම් තත්ත්වයක් යටතේ වුවද සිංහලයන්ට, විශේෂයෙන්ම සිංහල බෞද්ධයන් හද පත්ලෙන්ම විරුද්ධ බව කිසි විටෙකවත් අමතක නොකළ යුතුය. බටහිරයන් සියලු නීති දමන්නේ බෞද්ධයන්ටය. ලෙබනනයට විරුද්ධව ඊශ්‍රායලය ගෙන යන ක්‍රියාමාර්ගයට බටහිරයෝ විරුද්ධ නොවෙති. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ගැන බටහිරයන්ගේ බයිලා පැත්තකට විසිකර අපේ ඇසින් ඒ දෙස බැලූ කල සිංහල බෞද්ධයන් මෙතරම් බටහිරයන්ගේ වෛරයට පාත්‍ර වන්නේ ඇයිදැයි තේරුම්ගත හැකිය. (බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ගැන විස්තර විද්‍යුසර ලිපි පෙළෙහි දැක්වෙයි)

අද කළ යුත්තේ ඊනියා සටන් විරාම ගිවිසුම අමතක කර ඉලක්ක සහිතව ආණ්ඩුවේ න්‍යාය පත්‍රයකට අනුව කොටි සුන්නත්දූලි කිරීම සඳහා කටයුතු කිරීමය. හමුදාව හුදෙක් ප්‍රතිචාර දැක්වීම්වලට පමණත් සීමා විය යුතු නොවෙයි. සීමිත මෙහෙයුම්වලින් අවසානයේදී පාඩුව හමුදාවට හා ආණ්ඩුවටය. ආණ්ඩුවක ප්‍රධානම කාර්යය රාජ්‍යයේ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමය. එහිදී හමුදාව යොදාගැනීම අනිවාර්ය වෙයි. හමුදාවේ අත්බැඳ තැබීමට කටයුතු කිරීමෙන් රනිල් වික්‍රමසිංහ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් එහි නියෝජිතයා ලෙස සිංහලයන්ට විරුද්ධව ක්‍රියා කළේය. ආණ්ඩුවට හමුදාව සීමිත ආකාරයකින් නොව උපරිම ආකාරයකින් යොදාගැනීම හැර වෙනත් විකල්පයක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva